# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2116/11 - 2019 මාර්තු මස 26 වැනි අඟහරුවාදා - 2019.03.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78(x)(A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය අ. ඉබතුල් රවුෆ් හකීම් වන මා විසින්, ඇක්වයිනාස් කොලේජ් ඔෆ් හයර් ස්ටඩීස් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබාගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, මේ පනත යටතේ සාදන ලද සහ 2017 පෙබරවාරි මස 07 වැනි දින අංක 2005/11 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන ''(5) කෘෂි කර්මාන්ත කළමනාකරණ විද්‍යා ගෞරව උපාධිය'' යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

**I වන උපලේඛනය**

***කොන්දේසි***

ඇක්වයිනාස් කොලේජ් ඔෆ් හයර් ස්ටඩීස් ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන ලද ඉංග්‍රීසි පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ඕනෑම විෂය ධාරාවක් යටතේ (''ඉංග්‍රීසි'' විෂයය ප්‍රධාන විෂයයන් තුනෙන් එකක් විය යුතු ය) 'S' (සාමාන්‍ය) සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම හෝ සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූලව කටයුතු කළ යුතු ය.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය පිළිබඳ කෙටි යෙදුම* |
|---|---|
| ඉංග්‍රීසි පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව | බීඑඩ් ගෞරව (ඉංග්‍රීසි) |

අ. ඉබතුල් රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජලසම්පාදන හා
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 මාර්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

04 - 254


1A - PG 4445 — 517 (2019/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*